**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්තකාල පොත් පරිත්‍යාග ලැබීම් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැරකළයුතු වුවත්, රු.1,196,293 ක් සමුච්චිත අරමුදලටද, රු.214,895 ක් පරිත්‍යාග ගිණුමට ද බැරකර තිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රමාණය පර්චස් 260.3 ක් වූ ඉඩම් 5 ක් සහ ප්‍රමාණය හඳුනාගෙන නොතිබුණු ඉඩම් 4 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දින සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කරන බව. | තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.25,840,261 ක් වූ විෂයන් 07 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මෙම ශේෂයන් පිළිබඳ ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් ලබාගනිමින් පවතින බව. | ලේඛන සකස් කළ යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

### 1.7.1. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ වගන්ති අංක 20 | 1994 සහ 2004 වර්ෂවල තක්සේරු පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | තක්සේරු ප්‍රතිශෝධනය සඳහා දේපල 18,000 ක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති බව. | තක්සේරුව කරවාගෙන නව රේට අනුව වරිපනම් අය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 83(ii) | සේවක ණය අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2025 ජනවාරි 01 දින සිට අත්තිකාරම් ගිණුම ආරම්භ කිරීමට කටයුතු කරන බව. | නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 371 (ආ) | 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් වටිනාකම රු.2,793,113 ක් අයකරගෙන නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් මූලික විමර්ෂණ සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මු.රෙ. 571 | වසර 2 ඉක්මවූ රු.1,599,767 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.77,987,661 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.230,033,227 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | --------- | ----------------- | ------------ | -------- | ---------- | ------------ | -------- | ------- | ---------- |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,000,000 | 14,472,663 | 13,446,212 | 402,801 | 14,269,791 | 15,636,473 | 15,268,512 | 457,961 |
| (ii) | කුලී | 7,269,375 | 8,079,031 | 7,955,471 | 111,850 | 7,218,558 | 7,126,474 | 7,003,131 | 59,448 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,272,000 | 2,069,946 | 2,069,946 | - | 1,804,000 | 1,977,584 | 1,977,584 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,857,315 | 22,889,615 | 22,889,615 | - | 9,992,613 | 13,614,636 | 13,614,636 | - |
| | | -------------- | ------------ | ------------ | ------------ | ------------ | ------------ | ------------ | ------------ |
| | | 49,398,690 | 47,511,255 | 46,361,244 | 514,651 | 33,284,962 | 38,355,167 | 37,863,863 | 517,409 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඳුනාගෙන තිබුණු වරිපනම් අයකළයුතු දේපල 16,260 ක් අතරින්, වරිපනම් අයකර තිබුණු දේපල 2,774 ක් පමණක් විය. | දේපල 13,587 කින් බදු අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | තක්සේරුව ලබාගෙන වරිපනම් අයකළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට වෙනත් ණයගැති ශේෂය රු.1,717,410 ක් අයකර ගැනීමටත් වියදම් ණය හිමි ශේෂය රු.7,741,421 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | ණයගැති ශේෂ අයකරගත යුතු අතර ණය හිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

### 3.2. නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයට පෙර සභා අරමුදලින් රු.55,000 ක් වැයකර, 2020 වර්ෂයේදී රු.201,000 කට ප්‍රත්‍යාගණනය කර, ගිණුම්ගත කර තිබුණු ප්‍රජාශාලාවක් සඳහා සකස්කර තිබුණු අත්තිවාරම වල් බිහිවී අත්හැරදමා තිබුණු අතර, වැය කළ මුදල නිෂ්කාර්ය වී තිබුණි. | මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 13 හා 14 ප්‍රකාරව කටයුතු කරන බව. | වත්කම භාවිතා කළහැකි පරිදි සකස් කරගත යුතුය. |

### 3.3. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.25,698,666 ක් වූ යන්ත්‍ර 3 ක් පවරාගෙන නොතිබුණි. | පවරාගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ග ප්‍රමාණය පර්චස් 60 ක පමණ වන දාගොන්න දොස්තරවත්ත පොදු පහසුකම් කටයුතු සඳහා වෙන්කළ ඉඩමෙහි හිමිකම තහවුරු කරගැනීම සඳහා ඔප්පුවක්, ඉඩමට පිවිසුම් මාර්ගයක් නොතිබුණු බවද, ඉඩම වල් බිහිවී ජරාවාස වී තිබුණු බවද, අසල්වැසියන් විසින් ඉඩමෙහි කුකුලන් සහ ඌරන් ඇති කරන බවද නිරීක්ෂණය විය . | එම ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමට තොරතුරු ලබා ගනිමින් පවතින බව. | සභාවට අයත් ඉඩම්වල අයිතිය තහවුරු කරගෙන නිසි පරිදි නඩත්තු කළ යුතුය. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |

### 3.4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ස්ථාන මාරුවී ගිය, මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය නිලධාරීන් 18 දෙනෙකුගෙන් රු.506,111 ක් වූ සේවක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය . |